# ශ්‍රී ලංකාවේ ක්‍රීඩා තොරතුරු අවශ්‍යතා හා ජාතික ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක අවශ්‍යතාව

එස්. ඒ. ඩී. එච්. නාමලී සුරවීර

නූතන මානවයා විසින් ක්‍රීඩාව, ජීවිතයේ ඉතා වැදගත් කොටසක් බව අවබෝධ කොට ගෙන ඇත. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ද ප්‍රබල අවධානයක් ක්‍රීඩාව සඳහා ලැබී තිබේ. එය ක්‍රීඩාව පිළිබඳ තොරතුරු අවශ්‍යතා ඇති කරවීමට ද ප්‍රබල හේතුවක් වී ඇත. ශ්‍රී ලාංකේය ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ පවතින තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීමේ මූලික අරමුණින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ. එහිලා ශ්‍රී ලංකාවේ ක්‍රීඩා තොරතුරු අවශ්‍යතා ඉටුකරගත හැකි විධිමත් වැඩ පිළිවෙළක් තිබේ ද යන ගැටලුව පාදක කොට ගෙන ඇත. අනුමානයෙන් තොර පහසු නියැදි ක්‍රමය (Non probability convenience sampling method) භාවිතයෙන් තෝරා ගත් නියැදිය සඳහා විශේෂයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, ජාතික ක්‍රීඩා සංගම් නිලධාරීන්, ක්‍රීඩා වෛද්‍ය නිලධාරීන් හා පර්යේෂකයින් ඇතුළත්ව ඇත. සමීක්ෂණ ක්‍රමවේදය පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ක්‍රීඩා තොරතුරු ගවේෂණයේ අරමුණු, තොරතුරු අවශ්‍යතා, තොරතුරු ගවේෂණයේ ගැටලු ආදිය පිළිබඳ ලබාගත් දත්ත විශ්ලේෂණයෙන් විවිධ නිගමනයන්ට එළඹී තිබේ. ඒ අනුව බහුතරයක් දෙනා විනෝදය සඳහා, මෙන් ම අධ්‍යාපනික කටයුතු සඳහා ද ක්‍රීඩා තොරතුරු ගවේෂණයට පෙළඹී ඇති බව හඳුනාගෙන තිබේ. තොරතුරු ගවේෂණය හා සම්ප්‍රේෂණයෙහි ලා ප්‍රමාණවත් මාර්ගෝපදේශකත්වයක් නොමැතිකම ක්‍රීඩා තොරතුරු ගවේෂණය ලා ප්‍රබල ගැටලුවකි. තොරතුරු එකතුව සංවිධානාත්මක හා නවතාවට පත් නොවීම, විද්‍යුත් මූලාශ්‍රයන්හි සීමාසහිත හා පරිගණක හා අන්තර්ජාල පහසුකම් නොමැතිකම එම ගැටලුව තවත් උග්‍ර කර ඇත. එහෙයින් ශ්‍රී ලාංකේය ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා සංවිධානගත විශේෂිත ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක අවශ්‍යතාව දැඩි වී තිබේ. එහි දී ක්‍රීඩා තොරතුරු අලෙවිකරණය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත.

මූල පද: ක්‍රීඩාව, ක්‍රීඩා විද්‍යාව, තොරතුරු මධ්‍යස්ථාන, තොරතුරු අලෙවිකරණය, ශ්‍රී ලංකාව